# ජාතික ගීයත් කොම්පියුටරයෙන්

(ගාමිණී රූපානන්ද)

"නවීන ලෝකයේ දියුණුවත් සමග වෙනස් වන තාක්ෂණික යුගයට අප නැඹුරු විය යුතුයි." යන කියමන සනාථ කරවමින් නවීන කොම්පියටර් තාක්ෂණ ශිල්පයේ දැනුම උපයෝගී කොට ගෙන කොම්පියුටර් ක්‍රමයට ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට පැවැත්වුණු උත්සවයක් ඊයේ (5ද) අපට මොරටුව සරසවියේදී දැක ගන්නට ලැබිණි.

මෙම උත්සවය ආරම්භයේදී වෙනද සුපුරුදු පරිදි ඇතින් දැල්වෙන ලෝහමය පොල් තෙල් පහන වෙනුවට මෙදින කොම්පියුටරයක විදුලි බොත්තමක් තද කිරීමෙන් අනතුරුව රූපවාහිනී තිරයක් මත අලංකාර පොල්තෙල් පහනක් දැල්විණි.

මෙම කාර්යය සම්පූර්ණ කෙරුණේ උත්සවයේ අමුත්තා වූ උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම් මහාචාර්ය ස්ටැන්ලි කල්පගේ මහතා අතිනි.

ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල අනුබද්ධිතව පිහිටුවනු ලැබූ මුල්ම කොම්පියුටර් මධ්‍යස්ථානය මොරටුව සරසවියේදී විවෘත කිරීමෙන් අනතුරුව පැවැති උත්සව සභාව අවසානයේ ගැඹවෙන ජාතික ගිය ගායනය කිරීම හා වාදනය සඳහා සිසුන් හෝ කිසිම ශිල්පියකු ඉදිරිපත් නොවීමද තවත් විශේෂ ලක්ෂණයක් විය.

කොම්පියුටරයේ විදුලි බොත්තමක් තද කිරීමෙන් එම කාර්යයද මනාව ඉටු විණි. විදුලි බොත්තම තද කරත්ම කොම්පියුරය තුළින් ඉතා මිහිරි සරින් ගැයුණු කොම්පියුටර් ජාතික ගිය සවන් වැකෙත්ම රැස්ව සිටි අමුත්තන් වශීකෘත වූ අතර තාක්ෂණික අංශයෙන් ශ්‍රී ලංකාව ලබා ඇති දියුණුව ගැන ප්‍රීති ප්‍රමෝදයට පත්වූහ.

DIVAINA - 06 March, 1984.